සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම : .................................................................... විභාග අංකය : ..................................

**I කොටස**

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම සුදුසු නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

---

1) සිදුහත් බෝසතාණන් වහන්සේට මිනිස් ලොව උපදින ලෙස ආරාධනා කර සිටියේ,
   1. සටිකාර නම් මහා බ්‍රහ්මයා ඇතුළු දෙවිවරුන් ය.
   2. සහම්පති මහා බ්‍රහ්මයා ඇතුළු දෙවිවරුන් ය.
   3. සතරවරම් දෙවිවරුන් ය.
   4. සක් දෙවිඳුන් ය.

2) වප්මඟුල් උළෙල දා සිදුහත් බෝසතුන් මෙනෙහි කළ භාවනාව වන්නේ,
   1. මෛත්‍රී භාවනාවයි.
   2. බුද්ධානුස්සති භාවනාවයි.
   3. ධම්මානුස්සති භාවනාවයි.
   4. ආනාපානසති භාවනාවයි.

3) "බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැ"යි බෝසතාණන් වහන්සේට ආරාධනා කරන ලද්දේ,
   1. සුද්ධෝදන රජතුමා ය.
   2. බිම්බිසාර රජතුමා ය.
   3. කොසොල් රජතුමා ය.
   4. උදේනි රජතුමා ය.

4) පා දෝවනයට ජලය තැබූ භාජනය උපමා කර ගනිමින් බුදුරජාණන් වහන්සේ දහම් දෙසුයේ,
   1. ආනන්ද හිමියන්ට ය.
   2. රාහුල හිමියන්ට ය.
   3. නන්ද හිමියන්ට ය.
   4. දේවදත්ත හිමියන්ට ය.

5) දියුණු වීමේ දොරටු අතර "අලීනතා" යනුවෙන් හැඳින්වෙන්නේ,
   1. දැහැමි ව ජීවත්වීමයි.
   2. හොඳට ඉගෙනගෙන තිබීමයි.
   3. කම්මැලි නැති කමයි.
   4. නිරෝගී බවයි.

6) ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ සෑම වසරකම,
   1. මාර්තු 22 වන දිනට ය.
   2. ජුනි 05 වන දිනට ය.
   3. ජුනි 26 වන දිනට ය.
   4. මැයි 22 වන දිනට ය.

7) දකුණු අකු ධාතූන්වහන්සේ නිදන් කර තැනූ ස්තූපය වන්නේ,
   1. ථූපාරාම දාගැබයි.
   2. රුවන්වැලි දාගැබයි.
   3. සෝමාවතී දාගැබයි.
   4. අභයගිරි දාගැබයි.

8) දුමින්දාගමනය හෙවත් "බෝධිආගමනය" සිදු වූයේ,
   1. උඳුවප් පුර පසළොස්වක පොහෝ දිනක ය.
   2. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක ය.
   3. ඇසළපුර පසළොස්වක පොහෝ දිනක ය.
   4. වෙසක්පුර පසළොස්වක පොහෝ දිනක ය.

9) සඟමිත් තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලාට වැඩ සිටීමට ඉදි කළ ආරාමය,
   1. කාලප්‍රාසාද පිරිවෙණයි.
   2. හත්ථාලක මෙහෙණවරයි.
   3. මහා විහාරයයි.
   4. අභයගිරි විහාරයයි.

10) බුද්ධ ශාසනයේ පැවිද්ද ලැබූ මුල්ම ශ්‍රී ලාංකිකයා වන්නේ,
   1. දෙවනපෑතිස් රජතුමා ය.
   2. අරිට්ඨ කුමාරයා ය.
   3. මහානාග යුවරජ ය.
   4. දුටුගැමුණු රජතුමා ය.

➢ පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ සටහන් කරන්න.

11) සිදුහත් බෝසතුන්ගේ සන්සුන් විලාසය අගය කරමින් නිබ්බුත පද ප්‍රකාශ කළේ යශෝදරා දේවියයි. (...............)

12) සියලු කෙලෙස් නසන නුවණ ආසවක්ඛය ඥාණය නම් වේ. (...............)

13) ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතැන් හිමිවූයේ ආනන්ද හිමියන්ට ය. (...............)

14) තමා ගැන සිතා තමා අකමැති දේ අන් අයට නොකර සිටීම "අත්තූපනායික ධර්මපරියාය" නම් වේ. (...............)

15) බුදුදහම ශ්‍රී ලංකාවට ලැබෙන විට ශ්‍රී ලංකාවේ රජකම් කළේ දෙවනපෑතිස් රජතුමාය. (...............)

➢ නිවැරදි පිළිතුර හිස්තැනෙහි ලියන්න.

16) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු ...................................................................... යි.

17) අපේ රටෙහි ජාතික වෘක්ෂය ...................................................... යි.

18) බුදු දහමට අනුව සියලු දේ වෙනස් වේ එය ...................................................... ලෙස හඳුන්වයි.

19) සීලය යනු .......................................... , ......................................... දෙකෙහි සංවර භාවයයි.

20) "දෝතේ ඇති වැලිකැට ගණනට ගුරුවරුන්ගේ අවවාද ලැබේවායි" ප්‍රාර්ථනා කළේ .................................. හිමියන් ය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වෙයි.

---

1)
1. මහාමායා දේවියගේ දෙමාපියන් ජීවත් වූ නුවර කුමක්ද?
2. අසිත තාපසතුමන් හඳුන්වන තවත් නමක් ලියන්න.
3. පෙර ආත්මභාවයන් සිහි කරන නුවණ කුමන නමකින් හැඳින්වේද?
4. දියුණුවේ දොරටු සඳහන් වන ජාතක කතාව කුමක්ද?
5. සතරාකාර වූ යහපත් වචනයන්ගෙන් දෙකක් නම් කරන්න.
6. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි දෙමාපියන් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.
7. අපේ රටේ ප්‍රධානතම ජාතික සංකේත දෙකක් නම් කරන්න.
8. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ වැඩම කළ මහරහතන් වහන්සේලා දෙනමක් නම් කරන්න.
9. "දැඩි ලෝභය දුකට පත්වීමට හේතු වේ" යන පණිවිඩය ගෙන එන ජාතක කතාව නම් කරන්න.
10. "මගේ අදහස ඉටු වූවා සේම ඔබේ අදහස ඉටු වේවා"යි ප්‍රාර්ථනා කරමින් බෝසතුන්ට කිරිපිඬු පූජා කළ තැනැත්තිය කවුරුන්ද?

(ල. 2×10=20)

2)
1. පස්මහ බැලුම්වලින් දෙකක් ලියන්න. (ලකුණු 02)
2. සිදුහත් කුමාරෝත්පත්තිය සමඟ සිදු වූ අසිරිමත් සිදුවීම් තුනක් ලියන්න. (ලකුණු 03)
3. සිදුහත් කුමාරයාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ පහක් නම් කරන්න. (ලකුණු 05)

3)
1. විහාරස්ථානයට යන විට රැගෙන යන දේවල් හතරක් නම් කරන්න. (ලකුණු 02)
2. "වන්දාමි චේතියං සබ්බං" යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)
3. පන්සිල් පද පිළිවෙළින් ලියන්න. (ලකුණු 05)

4)
1. බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කාහටද? (ලකුණු 02)
2. දෙමාපියන් "බ්‍රහ්ම" නමින් හඳුන්වන්නේ ඇයි? (ලකුණු 03)

3. සිගාලෝවාද සූත්‍රයට අනුව දරුවන් විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් පහක් නම් කරන්න.

(ලකුණු 05)

5)

1. ජාතික කොඩියේ අඩංගු සංකේත දෙකක් ලියන්න. (ලකුණු 02)
2. එම එක් සංකේතයක අර්ථය ලියන්න. (ලකුණු 03)
3. ජාතික කොඩිය පරිහරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

6)

1. පරිසරය යනු කුමක්ද? (ලකුණු 02)
2. බුදු තෙමඟුල නම් කරන්න. (ලකුණු 03)
3. පරිසරය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් උපසම්පදා භික්ෂූන් වහන්සේලාට පැනවූ විනය නීති පහක් නම් කරන්න. (ලකුණු 05)

7)

1. ප්‍රදේශ නවයකට ධර්මය ප්‍රචාරය කරනු ලැබුයේ කුමන සංගායනාවෙන් පසුවද? (ලකුණු 02)
2. දෙවනපෑතිස් රජු මහසඟරුවන සඳහා අනුරාධපුරයේ ඉදිකළ විහාර ආරාම තුනක් නම් කරන්න. (ලකුණු 03)
3. ලාංකීය ජනතාවට බුදු දහම ලැබීමත් සමඟ හිමිවූ දායාදයන් පහක් නම් කරන්න. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
Mz:L ,Wip kipa:aP - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | පිළිතුරු |
|---|---|---|---|---|---|---|

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | 2 | 11. | x |
| 02. | 4 | 07. | 1 | 12. | ✓ |
| 03. | 2 | 08. | 1 | 13. | x |
| 04. | 2 | 09. | 2 | 14. | ✓ |
| 05. | 3 | 10. | 2 | 15. | ✓ |

16. සතර බ්‍රහ්මවිහරණ
17. නා ගස
18. අනිත්‍ය
19. කය, වචනය
20. රාහුල

( ලකුණු 2 x 20 =40 )

## II කොටස

01.

i. දෙව්දහ නුවර
ii. කාලදේවල තවුසා
iii. පුබ්බේ නිවාසානුස්සති ඥාණය
iv. අත්ථස්සද්වාර ජාතකය
v. බොරු කීමෙන් වැළකීම,කේලාම් කීමෙන් වැළකීම,පරුෂ වචන කීමෙන් වැළකීම,හිස් වචන කීමෙන් වැළකීම
vi. දරුවන් පවින් වැළැක්වීම, යහපතෙහි පිහිටුවීම, ශිල්ප ඉගැන්වීම, සුදුසු වයසෙදි ආවාහ විවාහ කරදීම, සුදුසු කල දායාද පවරාදිම
vii. ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය.
viii. ඉට්ඨීය, උත්තිය, සම්බල, හද්දසාල නම් රහතන් වහන්සේලා
ix. ස්වර්ණ හංස ජාතකය
x. සුජාතා සිටු දියණිය

( ලකුණු 2 x 10 =20 )

02.

i. කාලය, දීපය, දේශය, කුලය, මව

ii.

- ❖ සතරවරම් දෙවිවරු සාධුකාර පැවැත්වීම
- ❖ අහසින් සිසිල් හා උණුසුම් දියදහරා දෙකක් මතුවීම
- ❖ පොළොවෙන් මතු වූ නෙළුම් මල් මත පුංචි කුමරු ගමන් කර දකුණු අතේ දබරැගිල්ල අහසට දිගුකර සිංහනාද පැවැත්වීම

iii. ගුරු බසට කීකරුවීම, හොඳින් ශිල්ප ඉගෙනීම, අභියෝග ජය ගැනීම, නිහතමානිබව, අන් අයට හිංසා නොකිරීම (ගැළපෙන වෙනත් ගුණාංගයන්ට ලකුණු දෙන්න)

03.

i. මල්, තෙල්, හඳුන්කූරු , පහන්තිර

ii. වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා

iii. පණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

04.

i. සිගාල පුත්‍රයාට/එක් පුතෙකුට

ii. සතර බ්‍රහ්ම විහරණ වලින් දෙමාපියන් යුක්ත නිසා(දෙමාපියන් දරුවන්ගේ වටිනාම වස්තුව නිසා)

iii. ආහාර පාන සපයා දීම, අවශ්‍යතා ඉටු කරදීම, පරම්පරාව රැක ගැනීම, පරපුරෙන් පැවරී ඇති දේපළ ආරක්ෂා කිරීම, දෙමාපියන් මිය ගියපසු පිංකම් කොට පිං අනුමෝදම් කිරීම

05.

i. කහපාට සිංහයා, අසිපත, බෝපත් සතර , තද රතුපාට, කහ තීරුව

ii. 66 පිටුව බලන්න

iii. 67 පිටුව බලන්න (ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු)

06.

i. අප අවට ඇති වටපිටාවයි.

ii. සිදුහත් බෝසතාණන් වහන්සේගේ ඉපදීම, බුදුවීම, හා බුදුරජාණන්වහන්සේ ගේ පිරිනිවන් පෑම

iii. ගස්වැල් නොකැපිය යුතුය
ගස්වල කොළඅතු කැඩීම නොකළ යුතුයි
නිල්වන් තණකොළ මත මළමුත්‍රා හෙළීම නොකළ යුතුය
කුණු රොඩු හා ඉඳුල් නොදැමිය යුතුයි.
වැසිකාලයේ නිශ්චිත ස්ථානයක වැඩ සිටීම කළයුතුය.

07.

i. තුන්වන ධර්ම සංගායනාව

ii. ඉසුරු මුණිය, වෙස්සගිරිය, චේතිය ගිරිය

iii. විධිමත් පුද පූජා, භික්ෂු සමාජය, සර්වඥ ධාතුන්වහන්සේලා , ස්ථූප ඉදිවීම, දුමින්දාගමනය